
# අතීතයෙන් ආ මිනිසා



මනුලී තිහෙත්මා ජයරත්න

# අතීතයෙන් ආ මිනිසා

© මනුලි තිනෙත්මා ජයරත්න

**කතෘගේ වෙනත් කෘති**

- සවිඳුගේ හපන්කම

**සියලුම හිමිකම් ඇවිරිණි.**

**ප්‍රථම මුද්‍රණය - 2024**
ISBN - 978-624-208-372-8

කතාව හා චිත්‍ර
මනුලි තිනෙත්මා ජයරත්න

**8 ශ්‍රේණිය**
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පිදුම

පෙනෙන වර්තමානයෙන් ඔබ්බට ගොස්

නොපෙනෙන අනාගතයක් මනසින් දැකීමට මංහසර කියාදුන්

ආදරණීය දෙමාපියන්ටත්

එතෙක් මෙතෙක් හමුවූ

සියලු ගුරු මව්පියවරුන්ටත්

........ සෙනෙහසින් ........

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භිකෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන

**“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණය ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛණකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර.

# 01

## තරුණ පර්යේෂකයාගේ අපූරු විසඳුම

බැරෑරුම් පෙනුමකින් මුව සරසාගත් මහාචාර්ය ජොනතන් තම පර්යේෂණාගාරයේ කාර්යාලයේ එහෙට මෙහෙට ඇවිදිමින් සිටියේ ය. ඔහුගේ රැළි වැටුණු නළලත්, එකට බැඳී ඇති අතැඟිලිත් ඔහුගේ කල්පනාවේ බැරෑරුම්කම කියාපෑවේ ය. කාර්යාලයේ අසුනක අසුන්ගෙන සිටි ජොනතන්ගේ පර්යේෂණ සහායකයා මෙන්ම සහෝදරයා ද වූ මහාචාර්ය ඇල්බස් තම සොයුරාගේ සක්මන් කිරීමෙන් වෙහෙසට පත් බැල්මකින් බලා සිටියේ ය.

"ජොනතන්, ඔබ ඔහොම කල්පනා කළාට ඉබේ මෙයට විසඳුමක් ලැබෙන්නේ නෑනේ. ටිකක් සන්සුන් වන්න."

ඇල්බස්ගේ වදන්වලින් එක තැන නැවතුනු ජොනතන් ඔහු දෙස හැරී බැලුවේ තම මුහුණේ වූ බැරෑරුම් පෙනුම වෙනස් කර නොගෙන ය.

"ඇල්බස්, මේක ඔබ හිතනවට වඩා සංකීර්ණයි. හිතන්න ටිකක්... වෙනත් ග්‍රහලෝක දැන් පෘථිවියේ තාක්ෂණයට ඉතා සමීපවයි සිටින්නේ. අප මේ මානසික රෝගයට නිසි ප්‍රතිකාර ක්‍රමයක් සොයාගැනීම ඉක්මන් කළ යුතුමයි. නව තාක්ෂණයේ මේ පසුබෑම මට හිතාගන්න බෑ."

ජොනතන්ගේ උස් කටහඬ කාර්යාලය පුරා පිළිරැව් දුනි. ඇල්බස් මහාචාර්යතුමා ජොනතන් දෙස බැලුවේ කණස්සල්ලෙන් යුතු බැල්මකිනි.

"අපි උත්සාහ නොකරනවා නෙමෙයිනේ. පෘථිවියේ මේ පිළිබඳ හොඳම පර්යේෂණ කණ්ඩායම ඉන්නේ අපි ළඟ. සාර්ථක ප්‍රතිඵලයක් ළඟදීම දිනයක අපට ලැබේවි."

ඇල්බස් තම සොහොයුරාව අස්වැසීමට විය. එවිට තම ස්වරය තරමක් සන්සුන් කර ගත් මහාචාර්ය ජොනතන් ඇල්බස් අසල අසුන් ගත්තේය.

"ඇල්බස්, මේ විසිහතරවන ශතවර්ෂය. තාක්ෂණය අතින් අපට කිසිම අඩුපාඩුවක් නෑ. ඒත් වසර කීපයක්ම ගතවුණත් මේ රෝගයට තවමත් කිසිම ප්‍රතිකාර ක්‍රමයක් හොයාගන්න බැරි වුණා. ඒක අපේ තාක්ෂණයේ ප්‍රබලත්වයට බලවත් පහරක්. දිනෙන් දිනම රෝගීන් ගණන වැඩි වෙනවා. මේක සමාජයීය ගැටළුවක්. මම හිතන්නෙ අන්තර් ග්‍රහලෝක සම්මේලනයේදී වෙනත් ග්‍රහලෝකවල නියෝජිතයින්ට මෙය වටිනා කරුණක් වේවි, පෘථිවිය මත ඇති අති ප්‍රබල තාක්ෂණය පසුබෑමකට ලක්වී ඇති බව සාධක සහිතව පෙන්වාදීමට."

මහාචාර්ය ජොනතන්ට තම දිගු වේගවත් විස්තරය නවත්වන්නට වුනේ කාර්යාලය සිසාරා ඇසුණු කටහඬක් නිසාය.

"මහාචාර්යතුමනි, ඔබතුමා මුණගැසීමට පැමිණ සිටිනවා ඔබේ පර්යේෂණ සහායක ඩේවිස් ස්ටබ්ස් මහතා."

පර්යේෂණාගාරයේ රොබෝ සහායිකාව ඇනාලාගේ කටහඬින් ජොනතන්ගේ මුහුණේ මද එළියක් මතු විය.

"ඔව්, ඔව්, ඔහුව මගේ කාර්යාලයට එවන්න." මහාචාර්ය ජොනතන් පැවැසීය.

"ඩේවිස් මේ වෙලාවෙ එන්නෙ නෑ, වැදගත් කරුණක් නැතිනම්."

ජොනතන් තම අසුනේ හරිබරි ගැසී වාඩි වුණේ මද සිනාවක් ඇතිවය. තත්පර කිහිපයක් වීමට පෙර කාර්යාලයේ විදුලි සෝපානයේ දොර ඇරී ඉන් පිටතට පිවිසියේ විඩාපත් පෙනුමැති තරුණ පර්යේෂකයෙකි.

"සුභ දවසක් ඩේවිස්! ඇතුලට එන්න."

ඇල්බස් සුහදශීලී ලෙස ඔහු පිළිගත්තේය.

"ස්තුතියි මහාචාර්යතුමනි"

ඩේවිස් මහාචාර්යවරුන් දෙදෙනා අතර අසුන් ගත්තේ විඩාපත් සිනාවක් පාමිනි.

"ඩේවිස්, මා විශ්වාස කරනවා ඔබේ එන්න ඇත්තේ පර්යේෂණවල සුළු හෝ ප්‍රගතියක් දැනුම්දීමට කියා..."

මහාචාර්ය ජොනතන් තවත් දෙයක් කීමට සූදානම් වුවත් තම සහෝදරයාගේ මුහුණ දුටු ඔහු නිශ්ශබ්ද විය.

"ඇත්තටම මෙය මගේ නව අදහසක් පමණයි. අපි මේ උත්සාහයත් අරන් බලමු."

ඩේවිස් ජොනතන් දෙස එක එල්ලේ බලාගෙන කීවේය.

"ඩේවිස්, ඇයි මෙතරම් විඩාවෙන්? සියලු මෙහෙයවීම් සිදු කරන්නේ කෘතිම බුද්ධියෙන් සැදූ මෙහෙයුම් මැදිරියෙන්නෙ."

මහාචාර්ය ඇල්බස් විමසිලිමත් හඬකින් කීවේය.

"මෙහෙයුම් මැදිරියත් අබලන් කියා නම් කියන්න එපා"

ජොනතන් දුන්නක් සේ ඉදිරියට නැමුණේය. ඩේවිස් හා ඇල්බස් තම සිනහව සඟවාගෙන සිටියේ අපහසුවෙනි. ඩේවිස් හිස දෙපසට වැනුවේ එසේ නොවන බව කීමටයි.

"මම ඊයේ සිටම පැරණි  කාලයට අයත් ලිපි ගොනු පරීක්ෂා කර බැලුවා.  මහාචාර්යතුමනි, මීට සියවස් තුනකට පමණ පෙර, එනම් විසි එක්වන ශතවර්ෂයේ දී පමණ මේ විදිහේ රෝග ලක්ෂණ පෙන්වන මානසික රෝගයක් ඇති වී තිබෙනවා. දැන් වගේම සියදිවි නසාගැනීම, තම වැඩකටයුතු පිළිබඳ සුළු හෝ උනන්දුවක් නැතිකම, නිතරම කල්පනා කිරීම වගේ ලක්ෂණ සහිත විශාදය නම් රෝගයක්. එහිදී ඔවුන් යොදාගෙන ඇති ඖෂධවලට වඩා අපේ ඖෂධ ඉතා දියුණුයි. නමුත් මේ ඖෂධ නිසා සිදුවන්නේ රෝගීන්ට තාවකාලික සුවයක් ලැබීම විතරයි. එහෙත් ඒ කාලයේ දී ඖෂධවලට වඩා වෙනත් ක්‍රමයක් මගින්, ඒ කියන්නේ සහනශීලී මානසික

වාතාවරණයක් පවත්වා ගැනීම මගින් මේ රෝගය පාලනය කර තිබෙනවා."

"ඒ කියන්නෙ?" මහාචාර්යවරුන් දෙදෙනා එකවිට ඇසුවෝය.

"ඒ ගැන වැඩි විස්තරයක් සඳහන් වෙලා නැහැ මහාචාර්යතුමනි. මට හිතෙනවා අපි විසි එක්වන සියවසෙන් සහය ලබා ගත යුතුයි කියා." ඩේවිස් පැවසීය.

"ඔබ අදහස් කරන්නේ.....?" මහාචාර්ය ඇල්බස් තම කටහඬ පහත් කරමින් මිමිණීය.

"ඔව් මහාචාර්යතුමනි, අපට කාල යන්ත්‍රය භාවිතා කිරීමට සුදුසුම අවස්ථාව මේක." ඩේවිස් පැවසුවේ ස්ථිරසාර හඬකිනි.

"නමුත් එය ඉතා අනතුරුදායක දෙයක්!" ඇල්බස් පැවසුවේ විසල් කරගත් දෙනෙතිනි.

“වසර තුන්සියයකට පෙර ලොවකට ගොස් මනුස්සයෙකු පැහැර පැහැරගෙන ඇවිත් ඔහුගෙන් මේ ලෝකයේ ගැටලුවකට ප්‍රතිකාර ක්‍රමයක් සොයා ගැනීමට උදව් ඉල්ලන්න!” ඇල්බස් පැවසුවේ කලබලකාරී කටහඬකිනි.

“මට සමාවෙන්න ඩේවිස්, මට බෑ මෙයට අවසර දෙන්න.” මහාචාර්ය ඇල්බස් කීවේ දැඩි හඬකිනි.

ඔහු ඩේවිස්ගේ බලාපොරොත්තු කඩවූ මුහුණත්, ජොනතන්ගේ කල්පනාභරිත මුහුණත් දෙස මාරුවෙන් මාරුවට බැලුවේය.

“ඩේවිස්, ඉක්මන් කරන්න. තාක්ෂණික කටයුතු පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් මේ සඳහා විශේෂ අවසරයක් ගන්න කියා ඇනාලාට දැනුම් දිය යුතුයි. මා යනවා මේ පිළිබඳව කටයුතු සූදානම් කිරීමට. ඉක්මනින් ඔබ දෙදෙනා ඇනාලා වෙත යන්න.”

එක්වරම තම අසුනින් නැගී සිටි මහාචාර්ය ජොනතන්ගේ හැසිරීම දෙස අනෙක් දෙදෙනා බලා සිටියේ දැඩි විස්මයකිනි. කාර්යාලය හරහා දුවමින් මහත් කලබලයකින් කබාය ඇඳ ගන්නා තම සොහොයුරා දෙස මහාචාර්ය ඇල්බස් බලා සිටියේ විශ්වාස කළ නොහැකි බැල්මකිනි.

"ජොනතන්, මේක මෙහෙම ක්ෂණිකව ගන්න පුළුවන් තීරණයක් නෙමෙයි." ඇල්බස් දැඩි හඬකින් තම සහෝදරයා ඇමතුවේය.

"ඇල්බස්, මට හිතෙනවා මෙය සාර්ථක වෙයි කියලා. ඉතා තාර්කික ප්‍රායෝගික ක්‍රමයක් හමුවේ එහි ඇති අනතුරුදායක බව අපට මොහොතකට නොසලකා හරින්න පුළුවන්. අපි මෙයත් උත්සාහ කර බලමු. ඔබ මා වෙනුවෙන් අමාත්‍යංශයෙන් අවසර ඉල්ලන්න. අමාත්‍යංශය මෙය මගහරින එකක් නෑ."

ජොනතන් ඇල්බස්ගේ උරහිස මත අත තබා සිහින් හඬින් ඉල්ලීමක් කළේය.

“හොඳයි...” මිනිත්තු කීපයක නිහඬතාවයකින් පසු ඇල්බස් දිගු සුසුමක් ද සමග එකග විය.

“අපි යමු ඩේවිස්.” ඇල්බස් විදුලි සෝපානය තුලට පිවිසියේ ය.

ඔවුන් දෙදෙනා පිටව ගිය පසු ජොනතන් තම පරිගණකය අසල අසුන් ගත්තේ කාර්යබහුල පැය කීපයකට සූදානමිනි. නමුත් මීට පැයකට පමණ පෙර ඔහුගේ නළලේ වූ රැලි කීපය අතුරුදන්ව තිබුණි.


# 02

## කාල තරණ යන්ත්‍රය හරහා

වෛද්‍යවරයෙකු වූ චාල්ස් ඩික්නස් මහතාට එදින තරමක් කාර්යබහුල දිනයක් වී තිබුණි. අතක් ගින්නට පිළිස්සී පැමිණි රෝගියෙකුට හදිසි සැත්කමක් කිරීමට ද ඔහුට සිදුවී තිබුණි. මහත් වෙහෙසකින් යුතුව තම නවාතැන වූ කුඩා කුලී නිවසට පැමිණි ඔහු ඇඳට වැටුණේ අවුල්වී පොඩිවී ගිය කමිසය හා කලිසමෙන්මනි.

එක්වරම මහත් ශබ්දයක් සමග විශාල ආලෝකයක් ඔහුගේ ගෙමිදුල මතට කඩා වැටුණි. ඔහුගේ මුළු නිවසම දෙදරන්නට විය. එම දෙදරීමත් සමඟ ඔහුගේ නිවස පොළොවෙන් උඩට එසවෙන්නට විය. කාන්දමකට ඇදී යන්නාක් මෙන් ඔහුගේ නිවස ආලෝකය තුළට ඇදී යන්නට විය. මිනිත්තුවකින් පමණ එම ආලෝකය ද සමඟ ඔහුගේ නිවස ද තිබූ තැනින් අතුරුදහන් විය.

මද වේලාවකට පසු වෛද්‍ය චාල්ස් ඩික්නස් තිගැස්සී අවදි විය. ඔහුගේ මුහුණින් දහඩිය පෙරෙමින් තිබුණි. තමන් ඒ  දුටුවේ සිහිනයක් බව ඔහුට පසක් විය. ඔහු තම මේසය මත වූ ඩිජිටල් ඔරලෝසුව දෙස බැලුවේය.




වතුර උගුරක් පානය කර සිත සන්සුන් කරගත් චාල්ස් නැවතත් ඇදේ දිගා විය. නමුත් නින්ද ඔහු වෙත ඒම ප්‍රතික්ෂේප කරමින් සිටියේය. පැයකට පමණ පසු යාන්තම් ඔහුගේ දෑස් පියවුණා පමණි. කන් බිහිරි කරවන තරම් හඬක් සමඟ ඇස් නිලංකාර කරවන තරම් ප්‍රබල ආලෝකයක් ඔහුගේ නිවසින් පිටත පෙනෙන්නට විය.

"මොකක්ද මේ වෙන්නෙ දෙවියනේ!"

තම උපැස් යුවල සෙවීමට මේසය අතපතගාන අතරේ චාල්ස් තමාටම කියා ගත්තේය.

හඬ සමග ආලෝකය තවත් වැඩිවුනේ අහසේ ඉරවල් දහයක් පෑයුවා හා සමානව ගෙම්දුල ආලෝකමත් කරමිනි. තම පාවහන් යුවල පළදාගත් චාල්ස් ගෙම්දුලට පිවිසියේ දෙනෙත් අඩවන් කරගෙනය. අද්භූත ආලෝකය වෙතට තමා ඇදී යන්නාක් මෙන් ඔහුට දැනුණි.

"දෙවියනේ!......... " චාල්ස් බියපත්ව කෑ ගැසුවේය.

එවිට ප්‍රබල ආලෝක කදම්බයත් සමගම ඔහු ඉවතට ඇදී යන්නට විය. චාල්ස්ගේ මුහුණෙන් දහඩිය පෙරමින් තිබුණි. ඔහු කොතරම් තදින් කෑ ගැසුවත් ඔහුගේ මුවින් පිටවූ එක් වචනයක්වත් ඔහුටවත් ඇසුණේ නැත. ජීවිතයත් මරණයත් අතර සටනක් මෙන් දැනුණු මිනිත්තු කිහිපයකට පසු චාල්ස් යම්කිසි පෘෂ්ඨයකට ඇද වැටුණි. ඒ සමගම ඔහුගේ සිහිය නැති වී දෑස් පියවුණි.

..............................

"ඔබට හොඳින්ම විශ්වාස ද මේ කම්පනය මොහුට දරාගැනීමට හැකි වෙන්න ඇති කියා?"

පර්යේෂණාගාරයේ ශල්‍යාගාර ඇඳක් මත වැටී සිටින විසි එක් වන සියවසට අයත් මිනිසා දෙස බලමින් මහාචාර්ය ඇල්බස් විමසුවේය. දැන් පැයක පමණ කාලයක් තිස්සේ කිසිඳු චලනයක් නොදක්වා ගල් පිළිමයක් මෙන් නිසලව සිටින මිනිසා දුටු ඔහුට දැනුනේ තරමක බියකි. ඔහුගේ දුඹුරු පැහැති හිසකෙස් මෙන්ම ඇඳුම් ද පොඩිවී අවුල් වී තිබුණි. ඇඳ අසල ඔහුගේ ශරීරයට සම්බන්ධ කර තිබූ යන්ත්‍රවලින් පෙන්නුම් කළේ ඔහුගේ හදගැස්ම සාමාන්‍ය වෙමින් පවතින බවයි.

"ඔහු තව සුළු මොහොතකින් යථා තත්වයට පත්වේවි මහාචාර්යතුමනි."

ආගන්තුක මිනිසාට සේලයින් ලබා දෙන අතරේ රොබෝ සහායිකාවක වූ නෝරා පැවසුවාය.

"නම :වාල්ස් ඩික්නස්

රට :එංගලන්තය

වෘත්තීය :වෛද්‍ය වෘත්තිය

වයස : අවුරුදු 55 "

පරිගණකයක තිරයකට මුහුණ ඔබාගෙන, තමා වසර තුන්සියයකට පෙර ලෝකයකින් ගෙන්වා ගත් මිනිසා පිළිබඳ තොරතුරු සොයමින් සිටි මහාචාර්ය ජොනතන් තම සොයා ගැනීම් ඩේවිස්ට ඉදිරිපත් කරමින් සිටියේය.

"මහාචාර්යතුමනි, ඔහුට සිහිය එනවා!"

නෝරාගේ කටහඬින් ජොනතන් හා ඩේවිස් ඇඳ අසලට දුව ගෙන ආවෝය.

"වෛද්‍ය වාල්ස් ඩික්නස්, ඔබට මාව ඇහෙනවද? ඔබට ගැටලුවක් නෑ නේද?"

වාල්ස්ගේ කණට සම්බන්ධ කර තිබූ මයික්‍රෆෝනය අතට ගත් ජොනතන් කලබලකාරී කටහඬකින් විමසුවේය.

"ම්…හ්………"

වාල්ස් දෑස් අඩවන් කර කරගෙන දුර්වල හඬකින් මිමිණීය. නෝරාගේ සේලයින් සැපයුම නිසා තවත් නිහඬ මිනිත්තු කිහිපයකට පසු වාල්ස් සම්පූර්ණ සුවය ලබන්නට විය.

"මම මේ කොහෙද ඉන්නේ?"

වාල්ස් ඇඳෙන් නැගිටීමට උත්සාහ කරමින් තමා වටේ සිටින මිනිසුන් තිදෙනාත් රොබෝවරියත් දෙස කම්පනයට පත් බැල්මකින් බැලුවේය.

"කලබල වෙන්න එපා මහත්මයා. නෝරාගේ සහායෙන් මගේ කාර්යාලයට පැමිණි පසු ඔබට මා සියල්ල පැහැදිලි කර දෙන්නම්. මෙහිදී ඔබට කිසිම අනතුරක් වෙන්නෙ නෑ. ඔබට ආරක්ෂිතව නැවත ඔබේ නිවසට යා හැකි බව මම ඔබට සහතික වෙනවා.

නෝරා, ඔබ ඉක්මන් කරාවි යැයි මා බලාපොරොත්තු වෙනවා.”

මහාචාර්ය ජොනතන් ගේ වදන් හමුවේ චාල්ස් තරමක් සන්සුන් වූ බව පෙනුණි.

..............................

ස්වයංක්‍රීය රෝද පුටුවක අසුන් ගෙන සිටි චාල්ස් ඩික්නස් මහතා නෝරාගේ සහායෙන් මහාචාර්ය ජොනතන්ගේ කාර්යාලයට පැමිණියේය. ඔහුගේ මුහුණේ විශ්මය නොඅඩුවම පිරී තිබුණි. කාර්යාලයේ අසුන් තුනක වාඩි වී සිටි ඇල්බස්, ජොනතන් හා ඩේවිස් සිටියේ කල්පනා ලෝකයක සැරිසරමිනි.

“මහාචාර්යතුමනි, චාල්ස් මහතා දැන් යථා තත්ත්වයට පත්ව සිටිනවා.”

තිදෙනාම පියවි ලෝකයට පැමිණියේ නෝරාගේ කටහඬිනි.

“ස්තූතියි නෝරා! ඔබට දැන් යන්න පුළුවන්”

මහාචාර්ය ඇල්බස් පැවැසීය.

"ඉදිරියට එන්න"

මහාචාර්ය ජොනතන්ගේ නියෝගයට අවනත වූ ස්වයංක්‍රීය රෝද පුටුව ඉදිරියට පැමිණියේ චාල්ස් ගේ මුහුණේ තිබූ විශ්මය වැඩි කරමිනි.

"මම මේ කොහෙද ඉන්නේ?"

ඔහු උස්හඬින් ඇසුවේ එම විශ්මයද සමඟයි.

"මහත්මයා, ඔබට මතකද යම්කිසි ආලෝක කදම්බයක් සමඟ ඔබ මෙහි පැමිණි හැටි?"

"මට මතක විශාල ආලෝකයක් පමණයි."

මහාචාර්ය ඇල්බස් ගේ ප්‍රශ්නයට චාල්ස් පිළිතුරු දුන්නේ තරමක් කල්පනා කිරීමෙන් පසුවයි.

"ඔබට යම් අදහසක් තිබෙනවාද මානසික රෝ....."

මහාචාර්ය ජොනතන්ට තමා පැවසීමට ගිය දේ මඟ නැවැත්වීමට සිදුවූයේ ඇල්බස් ඔහු වෙත එල්ල කළ දරදඬු බැල්ම නිසා ය.

"ඔබගේ මතකය හොඳින් නේද?"

මෙතෙක් නිහඬව සිටි ඩේවිස් විමසිලිමත් ලෙස ඇසුවේය.

"ඔව්, අනිවාර්යෙන්ම. ඔබ කවුද? මේක මම ජීවත් වූ වටපිටාව නම් නෙමෙයි." චාල්ස් වටපිට බැලුවේය.

"ඔව්, මේක වෙනස් ලෝකයක්." ජොනතන් ඇස් කරකවමින් කීවේය.

"චාල්ස් මහත්මයා, ඔබ ඉන්නේ වසර තුන්සියයකට පසු ලෝකයක. අපි ඔබ මෙහි ගෙන්වා ගත්තේ අපට ඔබෙන් උපකාරයක් අවශ්‍ය නිසයි."

චාල්ස් කතා කර ගැනීමට ද නොහැකිව විසල් කරගත් දෙනෙතින් බලා සිටියේය.

“මහත්මයා, මේ ලෝකයේ පැතිරී ගොස් තිබෙනවා එක් මානසික රෝගයක්. අපට තවමත් ඊට ප්‍රතිකාරයක් සොයා ගත නොහැකිවයි තිබෙන්නේ. මේ රෝගයට අප සොයාගෙන ඇති ඖෂධවලින් ඇතිවන්නේ කෙටිකාලීන සුවයක් පමණයි. නමුත් අපට අවශ්‍ය දිගුකාලීන ප්‍රතිකාර ක්‍රමයක්. මේ රෝගය ගැන සියලු දත්ත අපගේ රොබෝ සහායිකාව ඇනාලාගෙන් ඔබට දැනගත හැකියි. ඇනාලා ඒ සියල්ල ඔබේ කාමරයේ ඇති පරිගණකයට ඇතුළත් කරලයි තිබෙන්නේ. ඇය ඔබේ පරිගණකයට සම්බන්ධ වී ඔබට සහාය දක්වාවි. හෙට උදෑසන වන විට ඔබ එම තොරතුරු පිළිබඳ දැනුවත්ව පැමිණෙන්න.”

ඩේවිස් සිදුකළ එම දීර්ඝ විස්තරයෙන් කම්පනයට පත් වූ චාල්ස් අපහසුවෙන් වචන ගැට ගසා ගත්තේය.

“ඉතින් මගෙන් විය යුත්තේ මොනවාද?”

"විසි එක්වන සියවස, එනම් ඔබේ කාලයේ දී විශාදය නමැති රෝගයක් පැවති බව අපි දන්නවා. සහනශීලී ලෙස මානසික තත්වය පවත්වා ගැනීම තුළින් ඒ කාලයේ එම රෝගය පාලනය කර තිබෙන බව අපට දැනගන්නට ලැබුණා."යි ඩේවිස් පැවසුවේය. චාල්ස් එය හිස වනා අනුමත කළේය. ඉන් අනතුරුව හඬ අවදි කළේ මහාචාර්ය ඇල්බස් ය.

"අප ඔබෙන් බලාපොරොත්තු වන්නේ මේ ලෝකයට ගැලපෙන ලෙස එම ක්‍රමවේද ආදේශ කිරීම මගින් අපගේ ගැටලුවට පිළියමක් ලබා ගැනීමයි. අප හෙට මේ පිළිබඳ වැඩි විස්තර කතා කරමු. ඔබ අතිශය වෙහෙසට පත්ව සිටින බව මට පේනවා. ඔබට දැන් අවැසිම දේ නින්ද. සුබ රාත්‍රියක් ඔබට."

# 03

## සුපිරි මෝටර් රථයෙන් සවාරියක්

"මට මෙහෙන් යන්න ලැබෙන්නේ කවදාද?"

පසුදා උදැසන දහයට පමණ චාල්ස් ඩික්න්ස්, ඇල්බස් හා ජොනතන් වෙත තම පළමු පැනය ඉදිරිපත් කළේය.

"නුදුරේදීම මහත්මයා. ඔබ කිසි ලෙසකවත් බියක් ඇති කරගත යුතු නෑ. අපි ඔබෙන් බලාපොරොත්තු වන්නේ උපකාරයක්. ඉන් අනතුරුව ඔබට ආරක්ෂිතව ආපසු යාමට හැකි වෙනවා."

මහාචාර්ය ඇල්බස් චාල්ස් ගේ උරහිස මත තම අත තබා කාරුණික ලෙස පැවසුවේය.

"ඔබ මේ රෝගය පිළිබඳ සියලු තොරතුරු ඇනාලාගේ මාර්ගයෙන් දැන ගත්තා නේද මහත්මයා?"

මේ වැඩ වැඩකටයුතු තවත් ප්‍රමාද වන්නේ මන්දැයි සිතමින් මහාචාර්ය ජොනතන් ඇසුවේය.

"ඔව්, ඇය ඉතා මිත්‍රශීලී හා බුද්ධිමත් රොබෝවරියක්!"

චාල්ස් පැවසුවේ දීප්තිමත් සිනහවක් පාමිනි.

"මහත්මයා, දැන් මේ පිළිබඳව ඔබට යම් අදහසක් ඇති. ඔබ මුලින්ම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ කුමක්ද?" ඩේවිස් වෛද්‍ය චාල්ස් ඩික්නස්ගෙන් ඇසුවේය.

"මම මුලින්ම මේ ලෝකයේ වත්මන් තත්වය පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගත යුතුයි. ඉතින් මම හිතනවා අද දවසේ ඔබගේ පර්යේෂණාගාරය ආසන්නයේ කුඩා සංචාරයක යෙදීමේ වරදක් නැතැයි කියා."

චාල්ස් කියූ දේ ඇසූ අනෙක් තිදෙනා තත්පර කිහිපයක් ඒ පිළිබඳව කල්පනා කිරීමට විය.

“චාල්ස් මහත්මයා, මම නම් හිතන්නේ නෑ ඒ වෙනුවෙන්....” ජොනතන්ගේ කථාවට බාධා කරමින් ඇල්බස් තම හඬ අවදි කළේය.

“ගැටලුවක් නෑ. ඔබත් සමග පැමිණීමට මා කැමැත්තෙන් ඉදිරිපත් වෙනවා. අපගේ ස්වයංක්‍රීය මෝටර් රථය තනිවම මෙහෙයවීම ඔබට තරමක් අපහසු වේවි.”

චාල්ස් ඔහු දෙස මිත්‍රශීලී සිනහවක් පෑවේය.

“ඇනාලා, රථ වාහන අංගනයට දැනුම් දෙන්න මගේ පෞද්ගලික මෝටර් රථය සූදානමින් තබන ලෙස. තවත් පැයකින් අපි පිටත් වෙනවා.”

“හොඳයි, මහාචාර්ය ඇල්බස්”

ඔහුට ප්‍රතිචාර ලැබුණේ අවකාශයෙන් නැගුණු ඇනාලාගේ කටහඬිනි.

..............................

මහාචාර්ය ඇල්බස් අතීතයෙන් ආ මිනිසා පිළිබඳව තම සහෝදරයා සමඟ සිදුකළ විවාදයකට පසු චාල්ස් සමඟ තත්පරයට මහල් විස්සක් පසු කළ හැකි අති වේගවත් විදුලි සෝපානයෙන් වාහන අංගනයට පිවිසියේය.

"ඔබ මා සමඟ පැමිණීම ගැන  මා ඔබට ස්තූතිවන්ත වෙනවා."

චාල්ස් මහාචාර්යතුමාට පැවසුවේ සුහදශීලී කටහඬකිනි.

"එය මටත් සතුටක්. අතීතය පිළිබඳව අධ්‍යයනය සම්බන්ධ විශේෂ ගෞරව උපාධියක් මට තිබෙනවා. ඔබත් සමඟ සුහදශීලීව කටයුතු කිරීමට එය විශාල හේතුවක් මහත්මයා."

මහාචාර්ය ඇල්බස් පැවසුවේය.

ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන විවිධ රථවාහන රාශියක් එම වාහන අංගනයේ විය. බැලූ බැල්මට ඒ සියල්ල ගුවන් යානා තටු, බෝට්ටු කොටස් ආදියෙන්

තනා තිබූ අති නවීන වාහනයි. වාහන අංගනයෙන් පිටවන දොරටුව අසල නවත්වා තිබූ අලු පැහැති මෝටර් රථයක් වෙත මහාචාර්ය ඇල්බස් පසුපසින් චාල්ස් ඩිකන්ස්ගේ ගමන් කළේය.

මෝටර් රථයේ බාහිර පෘෂ්ඨය මත වූ කුඩා කැමරාවක් හරහා මහාචාර්යවරයාගේ ශරීරය ස්කෑන් විය. නිල් පැහැති ආලෝකයක් සමග මෝටර් රථයේ දොරවල් ස්වයංක්‍රීයව විවෘත විය. මහාචාර්යතුමා මෝටර් රථයේ රියදුරු අසුනේ වාඩි වුණේ ය. චාල්ස් මෝටර් රථයේ දොරට ළං වූ සැනින් රතු පැහැති ආලෝකයක් නිකුත් විය.

"ඔහු මගේ මිත්‍රයෙක්. චාල්ස් ඩික්නස් කියන්නේ ඔහු."

මහාචාර්ය ඇල්බස් එසේ පැවසුවේ ඇනාලා වැනිම වූ කෘතිම බුද්ධියෙන් නිපදවූ රොබෝවරයෙකුටයි. ඒ සමගම චාල්ස්ට රථය තුළට පිවිසිය හැකිවන ලෙස මෝටර් රථයේ දොර විවර විය. රථය තුළට පිවිසි චාල්ස් ගේ මුහුණේ වූයේ පුදුමයට

පත්වූ පෙනුමකි. ඔහුගේ මුහුණ දුටු ඇල්බස් දීප්තිමත් ලෙස සිනාසුණේය. මෝටර් රථයක් එතරම්ම අති නවීන හා සුහුරු ලෙස නිපදවිය හැකි යැයි වාල්ස් කිසිලෙසකවත් නොසිතන්නට ඇත.

මෝටර් රථය සුඛෝපභෝගී ඉදිරිපස අසුනකින් හා පිටුපස අසුනකකින් සමන්විත විය. රථයේ වහලයට තරමක් යටින් සාදා තිබූ පෘෂ්ඨයත්, වහලයත් අතර භාණ්ඩ ගබඩා කිරීමට වෙන් වූ කොටසක් තිබුණි. වහලය  මත වූයේ ස්වභාවික ආලෝකයට සමාන ආලෝකයක් ලබාදෙන අති ප්‍රබල විදුලි පහනකි. මෝටර් රථයේ තිබූ වීදුරු ජනෙල් තුලින් පිටත සිටින්නෙකුට  ඇතුලත පෙනෙන්නේ නැත. එහෙත් ඇතුළත සිටින කෙනෙකුට පිටතින් පෙනෙන පුද්ගලයින් දැක බලා ගැනීමට පමණක් නොව, අවශ්‍ය නම් ඔවුන් පිළිබඳව දීර්ඝ විස්තරයක් පවා ලබාගත හැකි යන්ත්‍රයක් මෙම රථය සතු වේ.

මෙහි සියලු මෙහෙයුම් කටයුතු සිදුකළ පරිගණකය මෝටර් රථයේ හදවතයි. එක් එක්

ප්‍රදේශවල ධාවනය කිරීම සම්බන්ධ නීති රීති, ගමනාන්තයට ළඟාවීමට යා යුතු සුදුසුම මාර්ගය, මාර්ග තත්වය ආදී සියලුම තොරතුරු ලබාදීම සිදු කරන ලද්දේ මෙහෙයුම් මැදිරියට සම්බන්ධ වී සිටි නික් නම් රොබෝවරයා විසිනි.

"පුදුම වෙන්න එපා. මෙය අප සතු තාක්ෂණයේ එක් අවස්ථාවක් පමණයි."

චාල්ස් පියවි ලෝකයට පැමිණියේ ඇල්බස් ගේ කටහඬිනි.

"මෙය පැයට කිලෝමීටර පන්දහසක උපරිම වේගයෙන් ගමන් කළ හැකි මෝටර් රථයක්. ඔබට අවට වටපිටාවේ තත්වය අවබෝධ කරගත යුතු නිසා පැයට කිලෝමීටර සියයක පමණ වේගයෙන් ගමන් කරමු. විශේෂයෙන් නිරීක්ෂණය කළ යුතු අවස්ථාවලදී වේගය අවශ්‍ය පමණ අඩු කරමු. පරිගණක තිරය මත පිටත සජීවී තත්වය දර්ශනය කරන්න. මා හිතනවා වැදගත් ස්ථානවල විස්තර ඔබට අප වෙත ඉදිරිපත් කළ හැකියි කියා. මා දැන් දැනුම්

දුන් විට පැයට කිලෝමීටර සියයක වේගයෙන් ගමන ආරම්භ කරන්න. එක් එක් අවස්ථාවලදී මා දැනුම් දෙන පරිදි වේගය අඩු කරන්න. ඔබ ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතුයි."

ඇල්බස් පරිගණක තිරය දෙස බලා පැවසුවේය.

"හොඳයි මහාචාර්යතුමනි, ඔබ ගමන් කළ යුතු මාර්ගය දැනුම් දෙන්න."

අවකාශය තුළ කහ පැහැති ආලෝකයක් මෙන් දිස්වූ නික් පැවසුවේය. තිරය මත දර්ශනය වූ නගර සැලැස්ම මත ඇල්බස් යම්කිසි මාර්ගයක් සඳහන් කළේය. මහාචාර්යතුමාගේ නියෝගය සමඟ ඔවුන්ගේ ඉඟ වටා ආසන පටි දෙකක් ස්වයංක්‍රීයව තද විය. ඒ සමඟම මෝටර් රථය ධාවනය වන්නට වූයේ පැයට කිලෝමීටර සියයක වේගයකිනි. මෝටර් රථය ධාවනය වුණත් චාල්ස්ට දැනුනේ එකතැන නතර වී තිබෙන රථයක සිටිනවා වැනි වූ හැඟීමකි.

"මේ රථය ගමන් කරන්නේ ඉන්ධන වලින් ද?"

චාල්ස් තම සිත තුල කැකෑරෙමින් තිබූ පැනයක් මහාචාර්යවරයා වෙත ඉදිරිපත් කළේය.

"නැහැ, පෙට්‍රෝලියම් වැනි ද්‍රව ඉන්ධන දැන් භාවිතයේ නෑ. ඒ වෙනුවට රථවාහන ධාවනය වන්නේ සම්පූර්ණයෙන්ම සූර්ය ශක්තියෙන්. සූර්ය ශක්තිය රථවාහනවලට ආරෝපණය කරන මධ්‍යස්ථාන කිහිපයක්ම ඔබට දැකිය හැකි වේවි. ඕසෝන් වියනට හානි සිදුව ඇති නිසා පෘථිවියට අධිකව සූර්ය ශක්තිය ලැබෙනවා. කාලගුණ පාලන අමාත්‍යංශය බොහෝවිට ස්වභාවික උණුසුම් කාලගුණයම පවත්වාගෙන යන්නේ මේ නිසයි."

චාල්ස් විමතියෙන් යුතුව ඇල්බස්ගේ දීර්ඝ විස්තරයට සවන් දුන්නේ ය.

"කාලගුණ පාලන අමාත්‍යංශය?"

ඔහු ඇසුවේ ද එම විමතියත් සමඟයි.

"ඔව්, කාලගුණ පාලන අමාත්‍යංශය නූතන තාක්ෂණයේ ඉතා දියුණු අවස්ථාවක්. ඕසෝන් වියන

වෙනුවට වායුගෝලයේ නිපදවා ඇති කෘතිම ආරක්ෂිත ආවරණ පටලය පාලනය කිරීම එම අමාත්‍යාංශය සතු ප්‍රධානතම කාර්යය වෙනවා. ඊට අමතරව කෘතිම වර්ෂාව ඇති කිරීමත් භාරව තිබෙන්නේ එම අමාත්‍යාංශයට. කෘතිම වර්ෂාව නිසා සාගරවල ජල මට්ටම පවත්වා ගත හැකියි. ඔබ දැන් පසු කරන්නේ කාලගුණ පාලන අමාත්‍යාංශයයි."

ඇල්බස් එසේ පවසනවාත් සමගම චාල්ස් පරිගණක තිරය දෙස හැරී බැලුවේය. ඔවුන් පසු කරමින් සිටියේ මහල් තිහකින් පමණ යුතු වූ ඉතා විශාල ගොඩනැගිල්ලකි.

චාල්ස් පරිගණක තිරය දෙස අවධානයෙන් බැලුවේ ඉන්පසුවයි. අවට පරිසරයේ ශාක දැකිය හැකි වූයේ ඉතා අඩුවෙනි. අනෙක් වාහන ගමන් කළේ ඇසට නොපෙනෙන තරම් වේගයකිනි. මාර්ග දෙපස තැනින් තැන කුඩා කුටි තනා තිබුණි.

"මේ තිබෙන්නේ ඔක්සිජන් කුටීර. නිවෙස් හා ආයතන වලින් ඉවත් කරන දිරාපත් නොවන අපද්‍රව්‍ය

මගින් කෘත්‍රිමව ඔක්සිජන් නිපදවා ඒවා වායුගෝලයට මුදා හරින්නේ මේ කුටීර මගින්. එතකොට මේ තිබෙන්නේ කෘත්‍රිම ශාක. ඒවායින් ඔක්සිජන් හෝ ආහාර ලැබෙන්නේ නෑ.  ඒවා තිබෙන්නේ සෙවන ලබා ගැනීමට."

නික් තම කහ පැහැති ආලෝක ලපය තිරය මත එහා මෙහා යවමින් විස්තර කළේය.

"එතකොට ඔබ ශාක නැතිව ආහාර ලබා ගන්නේ කොහොමද?"

චාල්ස් එම ප්‍රශ්නය යොමු කළේ මහාචාර්යතුමා වෙතටයි.

"මහත්මයා, මේ ලෝකයට ස්වභාවිකව වර්ෂාව ලැබෙන්නේ ඉතාම කලාතුරකින්. කෘත්‍රිම වර්ෂාව සාගරවල ජලය පවත්වා පවත්වා ගැනීමට ඉතා වැදගත්. ඒවා  පිරිපහදු කර පානීය ජලය සපයා ගන්න පුලුවන්. නමුත් ශාක වර්ධනය සඳහා එයට විශේෂ රසායනික ද්‍රව්‍ය එක් කළ යුතුයි. එම ජලය යොදා

හරිතාගාරවල වගා කරන ශාකවලින් ආහාර නිපදවෙනවා. ඊට අමතරව විවිධ පෝෂක පෙති නිපදවා අලෙවි කරනවා. ස්වභාවික ශාකවර්ග තවමත් නොනැසී පවතින ස්ථානයක් තමයි පෘථිවියේ සමකය ආසන්නව ඇති සියුස් වනාන්තරය. එයට රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කරන ලද කෘතිම වර්ෂාව ලබා දී එය පවත්වාගෙන යාමට විශාල වියදමක් දරනවා. කෙනෙකුට එහි දින කිහිපයක් ගත කිරීමට අවසර ලබා දීමට විශාල මුදලක් අය කරනවා.”

එයට චාල්ස් සවන් දුන්නේ ඉතා උනන්දුවෙනි.

“ඔබ මේ පසු කරන්නේ රථවාහනවලට සූර්ය ශක්තිය ආරෝපණය කිරීමේ මධ්‍යස්ථානයයි.”

පරිගණක තිරය මත දිස් වූයේ සුවිසල් යන්ත්‍රයක් සහිත ස්ථානයකි. එහි ආරෝපණ යන්ත්‍රය තිබූ ස්ථානය පමණක් හිරු එළියට නිරාවරණය වී තිබුණි. මෝටර් රථ කිහිපයක් ඒ ආසන්නයේ නවතා තිබුණි. ආරෝපණ යන්ත්‍රය තුළට වාහනයක් ඇතුල් කර තත්පර කිහිපයකින් ඒවා ආරෝපණය වී නැවත

පිටතට පැමිණෙයි. ආරෝපණ යන්ත්‍රය ආසන්නයේ කෘතිම බුද්ධිය යොදා නිපදවූ රෝබෝවරියක් පරිගණකයකට සම්බන්ධ කර තිබුණි. ආරෝපණ මධ්‍යස්ථානයෙන් පිටතට යාමට හැකි වන්නේ කාඩ්පතෙන් පරිගණකයට මුදල් ගෙවීමෙන් පසුවය. චාල්ස් පරිගණක තිරයෙන් දෑස් ඉවතට ගත්තේය. ඔහු තමාට සුපුරුදු ඉන්ධන පිරවුම්හල් පිළිබඳව බර කල්පනාවකට වැටුණේය.

"මහත්වරුනි, ඉදිරියෙන් තිබෙන්නේ ජල පිරිපහදු මධ්‍යස්ථානයක්."

නික්ගේ වදන් ඇසුණු චාල්ස් පිටත බැලුවේය. කාලගුණ පාලන අමාත්‍යංශය මෙන්ම ජල පිරිපහදු මධ්‍යස්ථානයත් ඉතා විශාල ගොඩනැගිල්ලකි. එය පසුවනවාත් සමගම චාල්ස් මහාචාර්ය ඇල්බස් දෙස බැලුවේ ගැටලුසහගත බැල්මකිනි.

"මහත්මයා, ජල පිරිපහදු මධ්‍යස්ථානය මේ යුගයේ අතිශය වැදගත් ස්ථානයක්. ඔබ දන්නවනේ, පෘථිවියට ලබා දෙන කෘතිම වර්ෂාවෙන් ලැබෙන

ජලය පානය කිරීමට නොහැකි බව. එම ජලය පරිභෝජනයට සුදුසු ලෙස එහි සංයුතිය වෙනස් කරන්නේ මෙම ස්ථානයේදී. නමුත් කෘතිම වර්ෂාව නිපදවීමට එක් කරන ලද සංඝටක ඉවත් කිරීමෙන් පසු ඉතිරි වන්නේ ජලය ඉතා ස්වල්පයයි. ඒ නිසා වර්ෂා ජලයට අමතරව සාගර ජලය පිරිපහදු කර පරිභෝජනයට සුදුසු ලෙස සකස් කරන්නේත් මේ ස්ථානයේදී. මෙම තාක්ෂණයේ තවමත් යම් යම් ගැටලු පවතිනවා. එම නිසා පෘථිවිවාසීන්ට දිනකට ලීටර එකක ජල සලාකයක් පානය සඳහා හිමිවනවා."

මහාචාර්ය ඇල්බස් චාල්ස් වෙතට වානේ බෝතලයක් දිගු කළේය.

"මෙය අද දින ඔබේ ජල සලාකය."

චාල්ස් එය අතට ගත්තේය.

"ඔබට අවශ්‍ය නම් මෝටර් රථයේ $H_2O$ පෝෂක තිබෙනවා. ඔබට එයින් ජලයෙන් ලැබිය යුතු පෝෂණය ලබාගත හැකියි."

"ස්තිතූයි මහාචාර්යතුමනි."

චාල්ස් පැවසුවේ වෙළඳසැලක් පසුවන අතරේදී. ඒ සමගම සාමාන්‍ය ජනතාව ජීවත් වන නිවාස සංකීර්ණයක් ඔහුගේ ඇස ගැටුණි. කුඩා ඉඩක් තුළ වැඩි උසකින් යුතුවූ එය සවිමත් ප්ලාස්ටික් වලින් නිමවා තිබුණි.

"මහාචාර්යතුමනි, මම කැමතියි මෙහි වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව දැනගැනීමට."

චාල්ස් ඇසුවේ තම සිත තුල කැකෑරෙමින් තිබූ ප්‍රශ්නයකි.

"ඔව්, අනිවාර්යෙන්ම." මහාචාර්ය ඇල්බස් මද සිනාවක් පෑවේය.

"මෙහි වෛද්‍ය ක්ෂේත්‍රයේ නිරත වී සිටින්නේ කෘත්‍රිම බුද්ධියක්. මිනිසුන් සිදු කරන්නේ වෛද්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය රොබෝවරුන් නිර්මාණය කිරීම පමණයි. වෛද්‍ය මධ්‍යස්ථානවල පිහිටි ස්කෑන් මැෂින් ඉදිරියට ගියවිට එමගින් රෝගියා ස්කෑන් කර රෝගය

හඳුනාගෙන ඖෂධ නියම කරනවා. ඒ වගේම ශල්‍යකර්ම සඳහා අති නවීන රොබෝවරු නිපදවා තිබෙනවා.”

චාල්ස් ඇල්බස් දෙස බැලුවේ විසල් කරගත් දෙනෙතිනි.

“එතකොට ඖෂධ?” ඔහු විමසුවේය.

“බොහෝ රෝග සඳහා මිනිස් සිරුර තුළට යන්ත්‍රයක් මගින් කිරණ ඇතුල් කර, රෝගයට එරෙහිව ශරීරය තුළ ප්‍රතිශක්තිය නිපදවනවා. දිගුකාලීන රෝග සඳහා රෝගීන්ට පෞද්ගලිකව භාවිත කිරීමට එම යන්ත්‍ර ලබා ගන්න පුලුවන්.”

මහාචාර්ය ඇල්බස් චාල්ස්ගේ විස්මය පිරි මුහුණ දෙස බලා සිටියේය.

“මහත්මයා, අපි දැන් යමු නේද? ජොනතන් දැන් අපි එනතුරු නොඉවසිල්ලෙන් බලාගෙන ඇති.”

මහාචාර්ය ඇල්බස්ගේ ප්‍රකාශය අනුමත කරමින් චාල්ස් හිස වැනුවේය.

"මා සඳහන් කරන මාර්ගයෙන් නැවත පර්යේෂණාගාරය වෙත යමු."

මහාචාර්යවරයාගේ නියෝගයට අවනත වූ නික් වෙනත් මාර්ගයක් ඔස්සේ රථය ඉදිරියට ධාවනය කරන්නට විය. ගමන අතරමගදී මෝටර් රථයේ වීදුරුව තුළින් චාල්ස් පිටත බලා සිටියේය. රොබෝවරුන් පිළිබඳ කාර්යාංශයත්, අපරාධ කටයුතු පිළිබඳ කාර්යාංශයත්, වෛද්‍ය මධ්‍යස්ථානයකුත් පසුවන අතරේ මේ ලෝකයේ තවමත් දක්නට නොලැබුණු දෙයක් පිළිබඳ එක්වරම ඔහුට සිහිපත් විය.

"මහාචාර්යතුමනි, මේ ලෝකයේ කලාව, සංගීතය වැනි දේවල් නැතිද?"

ඔහු මහාචාර්ය ඇල්බස්ගෙන් විමසුවේය. මහාචාර්යතුමා චාල්ස්ගේ එම ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ මදක් කල්පනා කිරීමෙන් පසුවය.

"මම අතීතයේ පැවති කලාව පිළිබඳව අධ්‍යයනය කර තිබෙනවා. මම වගේම බොහෝ දෙනා

ඒ පිළිබඳව දන්නවා . නමුත් මෙහි එය ප්‍රායෝගිකව භාවිතා වෙන්නෙ නෑ."

"ඒ ඇයි?"

චාල්ස් කල්පනාකාරී ලෙස මහාචාර්ය ඇල්බස්ගෙන් විමසුවේය.

"මිනිසුන්ගේ කාර්යබහුලත්වය තමයි ලොකුම හේතුව. ඒ වගේම එය ප්‍රායෝගිකව භාවිතා කිරීමට තරම් දැනුමක් අපට නෑ. ඒ පිළිබඳව මූලික කරුණු දැන ගත්තට එවැනි දේවල් අපි නිර්මාණය කර නෑ. අතීතයේ පැවති ගීත වැනි කිසිවක් අප සතුව නැහැ. අපි සතුව තිබෙනවා විසිදෙවන සියවසට අයත් විවිධ ශබ්ද නිපදවිය හැකි යන්ත්‍රයක්. එහෙත් එයින් අලංකාර ශබ්ද නිපදවීමට අපි දන්නෙ නෑ. එම නිසා එය කෞතුක භාණ්ඩයක් ලෙස නම් කර තිබෙනවා."

මහාචාර්ය ඇල්බස් සිහින් කටහඬින් පැවසුවේය. චාල්ස්ගේ මුහුණේ වූයේ විමසිලිමත්

පෙනුමකි. ඔහු තම දෑත් මත නිකට තබා ගෙන කල්පනාවක නිමග්න විය.

"මහාචාර්යතුමනි, ඇයි ඔබ හිතුවේ නැත්තේ මා මෙහි පැමිණීමට හේතු වූ දෙයට විසඳුම මෙය බව. පර්යේෂණාගාරයට ගිය පසු මේ පිළිබඳ කතා කරමු. මෙයට අවශ්‍ය සංගීතමය විසඳුමක්."

මහාචාර්ය ඇල්බගේ විස්මයට පත් මුහුණ දෙස බලාගෙන චාල්ස් පැවසුවේය.

## 04

## සංගීතමය විසඳුමක්

මහාචාර්ය ඇල්බස් හා චාල්ස් පර්යේෂණාගාරයට ඇතුල් වන විටත්, වටිනා කාලය නාස්ති කිරීම පිළිබඳව ජොනතන් ඩේවිස් සමග කියවමින් සිටියේය. ඇල්බස් හා චාල්ස් දුටු විගස තම කතාව නවතා ගත්තත් ඔහුගේ මුහුණේ වූ බැල්ම මදක්වත් වෙනස් වූයේ නැත.

"මහාචාර්යතුමනි, ඔබ කියපු යන්ත්‍රය තවමත් ක්‍රියාත්මක වෙනවා නේද?"

චාල්ස් ඇල්බස්ගෙන් විමසුවේ මහාචාර්ය ජොනතන් ගේ දැඩි පෙනුම විස්මයජනක පෙනුමක් බවට පත්කරමිනි.

“ඔව් මහත්මයා. එය අපට ඉක්මනින් ලැබේවි ”. ඇල්බස් පැවසීය.

“සමාවෙන්න... ඔබ මොනවා ගැනද කියන්නේ?”

මහාචාර්ය ජොනතන් චාල්ස් සහ ඇල්බස් වෙත බර අඩි තබමින් ඇවිද ආවේය.

“ඔව් ජොනතන්, මටත් ඒකමයි දැනගැනීමට අවශ්‍ය .මහත්මයා, ඔබ කුමක්ද කිරීමටද අදහස් කරන්නේ? ”

මහාචාර්ය ඇල්බස් විමසුවේ අසුනක අසුන් ගනිමිනි. ජොනතන්, චාල්ස් හා ඩේවිස් බැරෑරුම් සාකච්ඡාවක් බලාපොරොත්තුවෙන් අසුන් ගත්හ.

"මෙහෙමයි... ඔබ සංගීතය පිළිබඳ මූලික කරුණු දන්නවා. නමුත් එය ප්‍රායෝගිකව භාවිතා කිරීමට තරම් දැනුමක් නෑ.?"

මහාචාර්යවරුන් දෙදෙනාම මුහුණට මුහුණ බලා හිස වැනුවෝය.

"හොඳයි... ඔබ දන්නවා, මේ රෝගය වෙනුවෙන්ම සියවස් ගණනක් තිස්සේ දියුණු වූ තාක්ෂණය, සමාජ ක්‍රමය වෙනස් කිරීම ප්‍රායෝගික නොවන විසඳුමක්. නමුත් මෙවැනි මානසික රෝග ඖෂධ වලින් පමණක් සුව කිරීමට නොහැකියි. මෙහි ඇති කාර්යබහුල වාතාවරණය නිසයි මෙම රෝගීන් අධික. රෝගය සුව කිරීමට නම් දිගුකාලීනව මානසික යහපැවැත්මක් පවත්වා ගත යුතුයි."

මහාචාර්ය ඇල්බස් වාල්ස් දෙස බැලුවේ දැස් සිහින් කර ගෙනයි.

"ඉතින් ඔබ යෝජනා කරන්නේ කුමක්ද? "

" ඔබ සතුව ඇති විවිධ ශබ්ද නිපදවිය හැකි උපකරණ මගින් සංගීත ඛණ්ඩ නිර්මාණය කර රෝගීන්ට ඒවා ඇසීමට සැලැස්වීම මගින් මෙවැනි රෝග සුව කළ හැකියි. එය හඳුන්වන්නේ සංගීත චිකිත්සාව කියා.මට විශ්වාසයි, මෙයින් සුළු හෝ ප්‍රගතියක් දක්නට ලැබේවි."

එම වදන්වලින් මහාචාර්යවරුන් දෙදෙනාගේත් ඩේවිස්ගේත් මුවගට නැඟුණේ දීප්තිමත් සිනාවකි.

"මා ඔබට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා මහත්මයා. මේ ගැන ඔබ ඔබට හොඳින්ම විශ්වාස ද?"

මහාචාර්ය ජොනතන් චාල්ස්ගේ දෑතින්ම අල්ලාගෙන පැවසුවේය. චාල්ස් එයට පිළිතුරු ලෙස ඔහුට මද සිනහවකින් සංග්‍රහ කළේය.

"මහත්මයා ,ඔබට සංගීත ඛණ්ඩ නිර්මාණය කිරීමට පුළුවන්ද? ඒ පිළිබඳව අපට යමක් කිරීමට නම් අපහසුයි."

මහාචාර්ය ඇල්බස්ගේ ප්‍රශ්නයෙන් චාල්ස් ගේ මුහුණේ ඇඳුනේ කල්පනාකාරී සිනහවකි.

"ඒ පිළිබඳව මටත් දැනුමක් නෑ."

"මොනවා ...එතකොට?"

මහාචාර්ය ජොනතන් උස් හඬින් ඇසුවේය. ඔහුගේ මුහුණේ වූ සිනාව මැකී යාමට ගත වූයේ එක් නිමේශයකි.

"මම හිතනවා ඔබගේ කාල යන්ත්‍රය නැවත භාවිතා කළ යුතුයි කියලා."

චාල්ස්ගේ වදන්වලින් විස්මයට පත් වූ අනෙක් තිදෙනා කතා කරගත නොහැකිව බලා සිටියහ.

"මගේ දුව ජෙසී සංගීතය පිළිබඳව විශාල දැනුමක් ඇති අයෙක්. ඇයට අලංකාර සංගීත ඛණ්ඩ නිර්මාණය කළ හැකි බවට මට විශ්වාසයි. මහත්වරුනි, එහි යම් කිසි ගැටළුවක් තිබේ ද?"

චාල්ස් මහාචාර්යවරුන් දෙදෙනාගේ විමසිලිමත් මුහුණු දෙස බැලුවේ ය.

“මහත්වරුනි, අපි මේකත් කරමු නේද? අතීතයෙන් එක් මිනිසෙක් ගෙන්වා ගැනීමේදී ගැටලුවක් වුණේ නැහැනේ.”

මෙතෙක් වෙලා නිහඬව සිටි ඩේවිස් කීවේය. මිනිත්තුවක් පමණ කල්පනා කළ මහාචාර්යවරුන් දෙදෙනා ද හිස වැනුවේ ඊට එකඟ වෙමින්.

“ඇනාලා, නෝරාට පණිවිඩයක් යවන්න වෛද්‍ය අංශයේ කටයුතු කාර්යක්ෂම කරන ලෙස. ඩේවිස්, මේ පිළිබඳව කටයුතු සූදානම් කරන්න. ඇනාලා, ජෙසී පිළිබඳව තොරතුරු මගේ පරිගණකයට ඇතුළු කරන්න.”

මහාචාර්ය ජොනතන්ගේ නියෝගයට අවනත වූ ඩේවිඩ් කාර්යාලයෙන් පිටතට ගියේය.

"මහත්මයා, ඔබත් සමඟ මට මට මේ ගැන කතා කිරීමට අවශ්‍යයි."

ජොනතන් චාල්ස්ට සුහදශීලී සිනහවකින් සංග්‍රහ කළේය. අනාගතයට අයත් මහාචාර්යවරුන් දෙදෙනාත් අතීතයට අයත් වෛද්‍යවරයාත් අසුන් තුනක හරි හරි බරි ගැසී වාඩි වූයේ දිගු සාකච්ඡාවකට මුල පුරන්නට යි.

..............................

චාල්ස්, ඇල්බස් ,ජොනතන් හා ඩේවිස් කාල යන්ත්‍රය අසල අසලට පැමිණියේ රාත්‍රී හතට පමණය. ඒ වනවිටත් ඇනාලා එම ස්ථානයේ සියලු කටයුතු සූදානම් කර තිබුණි. බිත්තියේ සවිකර තිබූ දැවැන්ත තිරය මත දිස් වූයේ අවුරුදු විස්සක පමණ ගැහැණු ළමයෙක්

එළිමහනේ සිටින ආකාරයයි. ඇයව දුටු විගස චාල්ස් ගේ මුහුණේ මතුවූ සිනහවෙන් කියැවුණේ ඇය ජෙසී ඩික්නස් බවයි.

"ඇනාලා , කාලතරණය සිදුවන විට එය ජෙසී ඩික්නස්ට පමණක් දැනෙන ලෙස නේද සූදානම් කළේ?"

"ඔව් මහාචාර්යතුමනි. කිසිම ගැටළුවක් නෑ. නමුත් අප ඉක්මන් කිරීම වඩා හොඳයි."

අවකාශයෙන් නැගුණු ඇනාලාගේ කටහඬ පැවසුවේය.

"මහත්මයා, මෙයින් ජෙසීට කිසිඳු ගැටළුවක් ඇතිවන්නේ නැහැ නේද?"

තරමක බියපත් කටහඬකින් චාල්ස් ඇසුවේය.

“කිසිම විපතක් වෙන්නෙ නෑ. ඔබ කලබල වෙන්න එපා.”

ඔහුගේ උරහිස මත අත තැබූ ඇල්බස්ගේ වදන්වලින් චාල්ස් තරමක් සන්සුන් විය.

“හොඳයි ඇනාලා, ක්‍රියාත්මක කරන්න.”

ජොනතන් එසේ පැවසීමත් සමඟම අපැහැදිලි හඬක් යන්ත්‍රයෙන් නැගෙන්නට විය. තිරය මත විශාල ආලෝකයක් දිස්විය. එම ආලෝකය දෙසට ඇදී යන අතරේ ජෙසී ඩික්සන් බෙරිහන් දෙන්නට විය. මිනිත්තු කිහිපයකට පසුව ඇය අතුරුදන් විය. තිරයද අඳුරු වී ගියේය.

චාල්ස්ගේ බියපත් හදගැස්ම ඔහු අසල සිටි ඇල්බස්ට පවා දැනෙන තරම් විය. නිහඬ මිනිත්තුවකට පමණ පසුව,

“මෙහෙයුම සාර්ථකයි.” ලෙස ඇනාලා පැවසුවාය.

එවිටම කාලතරණ යන්ත්‍රය තුළ සිට ගිලන් ඇඳකින් පිටතට පැමිණියේ සිහිය නැති වී දහදිය පෙරාගෙන සිටි ජෙසී ඩික්සන් ය. නෝරා එතැනට පැමිණ ගිලන් ඇඳ වෛද්‍ය අංශය වෙත ගෙන ගියේ ජෙසීට සේලයින් ලබා දීමට ය.

..............................

මිනිත්තු පහළොවකට පමණ පසු චාල්ස්, ඩේවිස් හා මහාචාර්යවරුන් දෙදෙනා වෛද්‍ය අංශය වෙත ගියෝ ය. ජෙසී කෙමෙන් කෙමෙන් සිහිය ලබමින් සිටියේ චාල්ස් ගේ

මුහුණට සැනසිල්ලක් ගෙන දෙමිනි. නෝරා සිටියේ ඇයගේ රුධිර පීඩනය පරීක්ෂා කරමිනි.

"ඕහ්...හ්...හා..."

එක්වරම ජෙසී කැස්සක් ද සමඟ දෑස් විවර කළාය. චාල්ස් ඇය වෙතට දුව විත් ඇඳ අසල වාඩිවී ඇයගේ අත ගත්තේ ය.

"තාත්තේ"

ජෙසී වචන ගැටගසා ගත්තේ අපහසුවෙනි.

ජෙසී ,ඔයාට අපහසුවක් නෑ නේද?"

චාල්ස් විමතියට පත් තම දියණියගෙන් ඇසීය.

"ඕහ්..නෑ...මම හොඳින්... "

ජෙසී තරමක් ප්‍රාණවත් හඬින් පැවසුවාය.

“ඒත් මේ කොහෙද? මොකක්ද අර ලොකු එළිය? අනික තාත්තේ ඔයා මොනවද මෙතන කරන්නෙ? ඔයා ඉන්න ඕන ඔයාගේ බෝඩිමේ නේද?”

ජෙසී ප්‍රශ්න වැලක් අසා ගෙන ගියා ය.ඇයට පිළිතුරු දීමට ඉදිරියට පැමිණියේ මහාචාර්ය ඇල්බස්ය.

“ඩික්නස් මෙනෙවිය, මම මහාචාර්ය ඇල්බස් .ඔබ ඉන්නේ වසර තුන්සියයක් අනාගතයේ.”

“මොකක්?”

ජෙසී  උස් හඬින් කෑගසා ඇඳෙන් නැගිටින්නට උත්සාහ කළාය.

“ඔයා කලබල වෙන්න එපා. ඔයා දැන් නිදාගන්න. අපිට  තව දවස් දෙක තුනකින්

මෙහෙන් යන්න පුළුවන් ජෙසී. අපෙන් මෙයාලාට උදව්වක් අවශ්‍යයි.”

ජෙසීගේ දෑතින්ම අල්ලා ගත් චාල්ස් පැවසුවේය.

“තාත්තේ.....”

ඇය පැවසුවේ කම්පනයට පත් හඬකිනි.

“ඩික්නස් මෙනෙවිය, දැන් ඔබට අවශ්‍ය විවේකය. ඔබ අද රාත්‍රිය වෛද්‍ය අංශයේ නෝරාත් සමඟ ගත කරන්න. හෙට උදෑසන නමයට ඔබ නෝරා සමඟ අප හමුවට පැමිණෙන්න. ඒ එන විට ඔබ සියල්ල පිළිබඳ දැනුවත්ව එන්න.”

“ඇනාලා, මේ සියල්ල පිළිබඳ ජෙසී මෙනෙවියව දැනුවත් කරන්න.”

මහාචාර්ය ජොනතන් පැවසීය.

"හොඳයි මහාචාර්යතුමනි."

ජෙසී අවකාශයෙන් නැගුණු හඬ නිසා පුදුමයට පත්ව තම පියා දෙස බලා සිටියේ කතා කර ගැනීමටවත් නොහැකි ව යි.

.............................

"සුභ උදෑසනක් ජෙසී!"

පසුදා උදෑසන පර්යේෂණාගාරය අසලදී ජෙසී හමු වූ විට චාල්ස් පැවසීය. ඔහුට සිනහවකින් සංග්‍රහ කළ ජෙසී තම පියාගේ අතින් අල්ලා ගත්තාය.

"ඔබ දැන් නම් සන්සුන් වගේ. දැන් ඔබට හැම දෙයක්ම පැහැදිලි ඇති නේද?"

මහාචාර්ය ඇල්බස් පැවසීය.

"ඔව් මහත්මයා, ඇනාලා සහ නෝරා ඉතා මිත්‍රශීලී රොබෝවරියන් දෙදෙනෙක් නේ. ඔවුන් සමඟ  කතාබහ කිරීමට ලැබීමත් ලොකු සතුටක්. ඒවගේම මගේ ක්ෂේත්‍රයෙන් ඔබට උදව් කිරීමට ඉතා කැමැත්තෙන් මම ඉන්නේ."

ජෙසීගේ සුහදශීලී කතාබහ අනෙක් සැම ගේ මුවගට සිනහවක් ගෙන ආවේය.

"ඔබට බොහොම ස්තුතියි. ආ... ඔබ හිතනවාද සංගීත චිකිත්සාව මෙයට සුදුසු විසඳුමක් වේවි කියා?"

එවර හඬ අවදි කළේ මහාචාර්ය ජොනතන් ය.

"ඔව්, අපි උත්සාහ කරමු. සංගීතය දේව භාෂාවක්. එයින් බොහෝ දේවල් වෙනස් කළ

හැකියි. මට විශ්වාසයි...ඔබට සංගීතයෙන් විශිෂ්ට ප්‍රතිඵලයක් ලබා ගත හැකි බව."

ඇයගේ අධිෂ්ඨානශීලී කටහඬ නිසා අන් අයගේ සිත්වල ඇති වූයේ ද එවැනිම අධිෂ්ඨානයකි.

"හොඳයි, අපි ඉක්මන් කරමු නේද ජෙසී?"

චාල්ස් තම දියණියගෙන් ඇසුවේය.

"ඔව්, පුළුවන් ඉක්මනට මේක කරලා ගෙදර යමු. ඒක ඔයාලටයි, අපිටයි හැමෝටම හොඳයිනේ."

ජෙසී කීවේ සිනාව අතරිනි. ඇයගේ සුහදශීලී වදන් අන් අයගේ සිත් පිනවීමට සමත් විය

"හොඳයි, එහෙනම් අපි විදුලි සෝපානයෙන් පර්යේෂණාගාරයට යමු."

මහාචාර්ය ඇල්බස් අසල තිබූ විදුලි සෝපානය තුලට පිවිසි විට අන් අයත් ඔහුව අනුගමනය කරමින් එතුළට පිවිසිය. ඔවුහු තත්පර තුනක් ගතවීමට මත්තෙන් විදුලි සෝපානයෙන් පිටතට පිවිසියෝය. ඔවුන් ඉදිරියේ වූයේ විවිධ යන්ත්‍ර සූත්‍ර සිය ගණනක් සහිත විද්‍යාගාරයකි. එය දුටු විට චාල්ස්ගේත් ජෙසීගේත් මුහුණු පුදුමයෙන් මහත් වීමට වැඩි වේලාවක් ගත වුණේ නැත.

"මේ තමයි අපගේ පර්යේෂණාගාරය. වර්තමානයේ ඇති දියුණුම පර්යේෂණාගාර වලින් එකක් මෙය."

මහාචාර්ය ජොනතන් පැවසුවේ ආඩම්බරයෙනි.

"ඇත්තටම මේ තැන හරිම විස්මයජනකයි. විසි එක් වන සියවසේ දී සිතීමටවත් නොහැකි අති නවීන උපකරණ යි මේ."

ජෙසී මහත් පුදුමයෙන් පර්යේෂණාගාරය දෙස බැලුවාය.

"ඔව්... ඇත්තෙන්ම, දැන් ඩික්නස් මෙනෙවිය, ඔබ කියන්න ඔබ කුමක් කරන්නට බලාපොරොත්තු වෙන්නේ?"

ඇල්බස් තම දැත් බැඳ ගත්තේය.

"ම්...ම්...මට සංගීතය උත්පාදනය කළ හැකි යන්ත්‍රය අවශ්‍යයි. මට එයින් සංගීත ඛණ්ඩ නිර්මාණය කිරීමට පැය දෙකක් පමණ

ගතවේවි. ඉන්පසු මට ඇනාලාගෙන් ඔබට පණිවිඩයක් යැවිය හැකි නම් මම මගේ තාත්තාව මෙතනට ගෙන්වා ගන්නම්. ඔහුට පුළුවන් රෝගියෙකුට එය අත්හදා බැලීමට. මට ඒ සඳහා රෝගියෙකු ගෙන්වා ගත හැකිද?"

මිනිත්තු කීපයක නිහඬතාවයකට පසු ජෙසී ඇසුවාය.එයට පිළිතුරු ලැබුණේ අවකාශයේ රැඳී සිටි ඇනාලාගෙනි.

"ඔව්. මා වෛද්‍ය මධ්‍යස්ථානයට දැනුම් දෙන්නම්. ඒ වගේම මට ඔබේ සභයට ප්‍රධාන පරිගණකයට ඇතුළු විය හැකියි. සංගීතය නිපදවිය හැකි යන්ත්‍රයි මේ ඔබ ඉදිරියෙන් තිබෙන්නේ."

ඔවුන් ඉදිරියේ මේසයක් මත තිබූ තරමක් විශාල කළු පැහැති පෙට්ටිය වෙත ඔවුන්ගේ

අවධානය යොමුවිය. හිදැස් හා විවිධ කූරු වැනි තහඩු එම යන්ත්‍රය මත විය.

“ස්තුතියි ඇනාලා. කරුණාකර ඔබට දැන් මට පැය දෙකක් පමණ ලබාදිය හැකිද?”

ජෙසී තම පියා සහ මහාචාර්යවරුන් දෙදෙනා වෙත හැරුණි.

“ඔව්. තවත් පැය දෙකකින් මම රෝගී පුද්ගලයෙක්ව මෙතනට එවන්නම්. මා හිතන්නේ ඔබට ඒ සම්බන්ධව ඩික්නස් මහතාගේ සහය අවශ්‍ය වේවි. ඒ නිසා මම සහ මගේ සහෝදරයාත් එන්නම්.”

මහාචාර්ය ඇල්බස් පැවසූ විට ජෙසී හිස වනා තම පියා දෙස බැලුවේය.

“තාත්තේ, ඔයා අවශ්‍ය හැමදේම ලෑස්ති කරගන්න.”

හිස වනා එයට එකඟ වූ චාල්ස්, මහාචාර්යවරුන් දෙදෙනා සමඟ පර්යේෂණාගාරයෙන් පිටතට ගියේ ය. ඒ ජෙසීට ඇගේ වැඩකටයුතු සිදු කිරීමට ඉඩකඩ සලස්වා දෙමිනි.

ඔවුන් පිටතට ගිය වහාම ජෙසී තමා ඉදිරියේ වූ පෙට්ටියේ තිබූ යකඩ කූරු එහෙ මෙහෙ කරමින් කාර්යබහුල වූවාය. වරින්වර වර ඇයගේ මුහුණේ හටගත් සිනාව ඇගේ වැඩකටයුතු සාර්ථක වන බවට ඉඟියක් විය. සංගීත පෙට්ටියෙන් දිගින් දිගටම විවිධ හඬවල් නිකුත් විය. මුලින් ඝෝෂාකාරී වුවත් තරමක් වෙලාව ගතවන විට එයින් නිකුත් වූයේ අතිශය මිහිරි සංගීතයකි. ජෙසී සංගීතය තුළ ඇලී ගැලී සිටින බව පෙනුණි. ඇනාලා පවා කිසිදු හඬක් නොනගා සිටියේ ඇයට බාධා වෙතැයි සිතාය.

“ඇනාලා, දැන් මට ප්‍රධාන පරිගණකයේ සංගීත ඛණ්ඩ පටිගත කිරීමට අවශ්‍ය යි.”

ජෙසී පැවසුවේ පැය එකයි මිනිත්තු විස්සකට පමණ පසුවය.

“ගැටලුවක් නෑ. ඔබට දැන් සිට පටිගත කළ හැකියි.”

ප්‍රධාන පරිගණකය මත නිල් පැහැති රවුමක් දිස්විය. ජෙසී සංගීත ඛණ්ඩ පටිගත කරන්නට වූවාය. එය අතිශය මිහිරි සංගීතයක් විය.ඇනාලා පවා එයින් විමතියට පත් හඬක් පිට කළාය. ඉතුරු පැය භාගයම ගතවුණේ මිහිරි සංගීත නාදයන් මධ්‍යයේය. ජෙසී එය නැවැත්වූයේ මුව පිරි මදහසක්ද සමඟයි.

“ඇනාලා, දැන් මහාචාර්යතුමාට දන්වන්න හැමදේම සූදානම් කියලා ”

"ඒක හරි ජෙසී මෙනෙවිය. මම ජීවිතේටම අහපු සුන්දරම දේ මේකයි."

ඇනාලා පැවසුවේ ප්‍රීතිමත් කටහඬකිනි .

"ස්තුතියි ඇනලා, මේ යන්ත්‍රය අතිශය දියුණු සංගීත භාණ්ඩයක්. සියලුම සංගීත භාණ්ඩවල එකතුවක්. මම නිර්මාණය කළ සංගීත නාදවලින් කෙනෙකුගේ මානසික රෝගයක් අනිවාර්යෙන්ම සුව කළ හැකි බවට මට විශ්වාසයි."

එවිටම පර්යේෂණාගාරයේ විදුලි සෝපානයෙන් පර්යේෂණාගාරයට පිවිසියේ මහාචාර්යවරුන් දෙදෙනා සහ චාල්ස් ඩික්නස් මහතාය .ඔවුන් සමගම මැදි වියේ පසු වූ මිනිසෙක් රැගත් රෝදපුටුවක් තල්ලු කරමින්

නෝරා ද පැමිණියාය. ආගන්තුක මිනිසාගේ මුහුණ දෙසට ජෙසීගේ අවධානය යොමුවුණි.

කිසිදු හැඟීමක් දැනීමක් නොමැති අයකු මෙන් ඔහුගේ සුදුමැළි දෑස් පහලට බර වී තිබුනි.

"මහාචාර්යතුමනි, මොහු වෛද්‍ය මධ්‍යස්ථානයේ ලියාපදිංචි අංක - 0091. නම - විලියම්. මොහුගේ පවුලේ කිසිඳු අයෙක් නෑ. ඒ නිසා ගැටලුවක් නෑ. ඒත් මොහුගේ ආරක්ෂාව සම්බන්ධව අප වගකිව යුතුයි. ප්‍රවේශමෙන් කටයුතු කරන්න."

නෝරා තරමක් චකිතයට පත් කටහඬකින් පැවසුවාය.

"හොඳයි නෝරා, ඒ ගැන බය වෙන්න එපා."

වාල්ස්ගේ වදන්වලින් තරමක් සැනසීමට පත් වූ නෝරා පර්යේෂණාගාරයෙන් පිටව ගියාය.

"හොඳයි ජෙසී, විලියම්ගේ වෛද්‍ය වාර්තා මම පරීක්ෂා කළා. ඔහු වරක් දිවි නසා ගැනීමට පවා උත්සාහ කරලා. කිසිවෙකුත් සමග මොහුගේ කතාබහක් නෑ. මා සමගවත් කතා කළේ නෑ. ඔබ සූදානම් ද?"

"ඔව් තාත්තේ. මහාචාර්යතුමනි, මේ උපකරණය සංගීත ක්ෂේත්‍රයේ දියුණුම අවස්ථාවක්. මගේ ලෝකයේදී කිසි විටෙක නිර්මාණය කළ නොහැකි අලංකාර සංගීත ඛණ්ඩ දහයක් පමණ මම පටිගත කළා. මම බලාපොරොත්තු වෙනවා තවත් සංගීත ඛණ්ඩ නිර්මාණය කිරීමට."

ප්‍රබෝධමත් කටහඬකින් පවසමින් ජෙසී රෝද පුටුව ප්‍රධාන පරිගණකය අසලට ගෙන ආවාය.

"ඩික්නස් මෙනෙවිය, දැන් අපි ප්‍රධාන පරිගණකයට මොහුව සම්බන්ධ කළ යුතුද?"

මහාචාර්ය ජොනතන් කීවේය. ඔහුගේ ස්වරයේ තිබුණේ අතිශය ප්‍රීතිමත් බවකි.

"අපි මුලින් එසේ කර බලමු. අත්හදා බැලීමක් ලෙස. නමුත් රෝගියාට වෛද්‍ය අංශයේ දී මේ ප්‍රතිකාරය ලබා දීම වඩා හොඳයි."

මහාචාර්යවරයාට පිළිතුරු ලැබුණේ චාල්ස්ගෙනි.

"හොදයි... ඇනාලා, ප්‍රධාන පරිගණකයේ ඇති සියලු පටිගත කළ සංගීත ඛණ්ඩ වෛද්‍ය

අංශයේ පරිගණකයට ද යොමු කරන්න. වෛද්‍ය අංශයේ ශ්‍රවණ උපාංග පරිගණකය සමග සම්බන්ධ කර තබන ලෙස නෝරාට දැනුම් දෙන්න."

මහාචාර්ය ඇල්බස් නියෝග කළේය.

"හොඳයි ජෙසී, අපි පටන්ගමු නේද?"

චාල්ස් පරිගණකය අසල තිබූ ශ්‍රවණ උපාංගය පරිගණකයට සම්බන්ධ කළේය. ජෙසී එය විලියම්ගේ කණට සම්බන්ධ කර පරිගණකයේ දර්ශනය වූ සංගීත ඛණ්ඩය ක්‍රියාත්මක කළාය.

මිනිත්තුවක් පමණ ගතවිය. මහාචාර්යවරුන් දෙදෙනා සිටියේ විලියම්ගේ මුහුණ දැඩි අවධානයෙන් නිරීක්ෂණය කරමිනි. ඔහුගේ මුහුණ ඉදිරියෙන් වූ කුඩා ස්වංක්‍රීය

කැමරාවක් මගින් ඔහුගේ මුහුණේ ඉරියව් පටිගත විය. සුළු මොහොතකින් බිමට බර වී තිබූ ඔහුගේ දෑස් තරමක් එසවිණි. විලියම් සංගීතයට හොඳින් සවන් දෙන අතරේම දෑස් එහෙ මෙහෙ යවන්නට විය. රෝද පුටුවේ පුටු ඇන්ද මත තිබූ ඔහුගේ දෑත් ඉහළට එසවී ශ්‍රවණ උපාංගය මත රැඳුණි. ඒත් සමගම ඔහුගේ මුහුණේ වූ හිස් බැල්ම අතුරුදහන් වී කුඩා හසරැල්ලක් මතුවිය.

මහාචාර්ය ජොනතන් තම දෑත් එකට බැඳගෙන බලා සිටියේ කුඩා දරුවෙකු මෙන් ප්‍රීතියෙන් ඉපිළෙමිනි.

"හරි."

ජෙසී ශ්‍රවණ උපාංග විලියම් වෙතින් ඉවත් කළාය. ඔහුගේ බැල්මේ වූයේ එයට

අකමැති පෙනුමකි. නමුත් ඔහුගේ මුව රැඳි හසරැල්ල තවමත් නොනැසී පැවතුණි.

"ඔබට මීට වඩා සුවපහසු ලෙස සංගීතය රසවිඳීමට තව මොහොතකින් පුළුවන්."

මහාචාර්ය ඇල්බස් විලියම්ගේ අතින් අල්ලා ගත්තේ ය.

"ස්තුතියි. මගේ ජීවිතයේ මා ලබා ගත් හොඳම ඖෂධය මෙයයි."

විලියම් අපැහැදිලිවුවත් හැඟුම්බර කට හඬකින් පැවසුවේය. ඒ සියලු දෙනාවම ම මවිතයට පත් කරමිනි.

"මේ තරම් සාර්ථක ප්‍රතිඵලයක්!"

මහාචාර්ය ජොනතන් මිමිණුවේය.

"හොදයි, අපි යමු නේද? විලියම්ගේ නොඉවසිලිමත් බව මට පෙනෙනවා."

චාල්ස් එසේ පැවසුවේ තම දියණියගේ අතින් අල්ලා ගනිමිනි.

"මට හරිම ආඩම්බරයි."

ඔහු ජෙසීගේ කණට කර පැවසුවේය.

# 05

## සාර්ථක මෙහෙයුමක අවසානය

මහාචාර්යවරුන් දෙදෙනා අතීතයෙන් පැමිණි පියා හා දියණිය සමඟ සුහද කතාබහක නිරත වෙමින් සිටියහ. පසුගිය දින දෙක පුරාවටම ජෙසී රැඳී සිටි විද්‍යාගාරයෙන් නිතරම මිහිරි සංගීතයක් ඇසෙමින් තිබුණි. ඇය සංගීතය උත්පාදනය කළ හැකි යන්ත්‍රය පිළිබඳව නිතරම කතා කළේ දැඩි ආසාවකිනි. ඇය දිවා රෑ නොබලා සංගීත ඛණ්ඩ නිර්මාණය කළේ එනිසායි. ඒවා පටිගත කිරීමට ජෙසීට ඇනාලා සහාය දැක්වූයේ ඉතා සතුටිනි. ඇයත් කිසිඳු දිනක අසා නොතිබුණු අලංකාර සංගීතයෙන් වශී වී සිටියා ය. එමෙන්ම මහාචාර්ය ජොනතන් හා ඇල්බස් ද සිටියේ අතිශය ප්‍රබෝධමත්වයි. මහාචාර්ය ජොනතන් සංගීත නාද ඇතුළත් කළ ශ්‍රවණ උපාංගයක් ද නිතරම කණේ තබාගෙන සිටියේය.

බොහෝ විට චාල්ස් හා  ඇල්බස් කාලය ගත කළේ මෝටර් රථයෙන් නගරය පුරා සංචාරය කරමිනි. එමෙන්ම වෛද්‍ය අංශයේ නවාතැන් ගෙන සිටි විලියම්ගේ වැඩකටයුතුවලද ඔවුහු නිරත වූහ. නමුත් නෝරා දක්ෂ වෛද්‍යවරියක ලෙස චාල්ස්ගේ උපදෙස් අකුරටම පිළිපැද්දා ය. ඇයගේ දෛනික වාර්තාවලට අනුව විලියම් කෙමෙන් කෙමෙන් සුවය ලබමින් සිටියේය. නමුත් දින දෙකකට පසු සිදුකරන පරීක්ෂණයෙන් සංගීත චිකිත්සාව පිළිබඳව අවසන් නිගමනයකට එළඹීමට නියමිතව තිබුණි. ඒ අනුව අද එම දිනයයි.

"ඔබ හිතන්නේ මේක සාර්ථක වෙයිද?"

මහාචාර්ය ජොනතන් තම සිතේ කැකෑරෙමින් තිබූ ප්‍රශ්නය ජෙසී හා චාල්ස් වෙත ඉදිරිපත් කළේය.

"ඔව් මහාචාර්යතුමනි, විලියම් දැන් සැහෙන සුවයක් ලබා ගෙන තියෙනවා. ඔබ දන්නවාද? ඔබගේ සමාජ ක්‍රමය නිසා එදිනෙදා කටයුතු පහසු වන බව ඇත්ත තමයි. ඒත් ඒ නිසා තමයි මේ වගේ මානසික

රෝග වැඩි වෙලා තියෙන්නෙත්. ඇයි මේ මිනිස්සුන්ට කිසිඳු රසවින්දනයක්, සමාජ ආශ්‍රයක්, විවේකයක් නැහැනේ. ඒත් මට තේරෙනවා මේ ක්‍රමය වෙනස් කළ නොහැකි බව. මොකද දැන් තිබෙන පාරිසරික අභියෝග ආදිය නිසා."

චාල්ස්ගේ වදන්වලට මහාචාර්යවරු දෙදෙනා සවන් දුන්නේ දැඩි උනන්දුවෙනි.

"කොහොම වුනත් දැන් ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. මම සංගීත ඛණ්ඩ පනහක් පමණ ප්‍රධාන පරිගණකයට ඇතුළු කළා. ඒ සමගම උපදෙස් පත්‍රිකාවකුත් ඇතුළත් කළා. ඔබ මේ සම්බන්ධව සියලුම වෛද්‍ය මධ්‍යස්ථාන දැනුවත් කළ යුතුයි. ඒ වගේම සාමාන්‍ය ජනතාවට මේවා රසවිඳිය හැකි පසුබිමක් නිර්මාණය කළ යුතුයි. එවිට තිබුණාට වඩා හොඳ ප්‍රගතියක් බලාපොරොත්තු විය හැකියි."

ජෙසීගේ වදන් මහාචාර්යවරුන් දෙදෙනාට ගෙන ආවේ මහත් ප්‍රීතියකි.

"ඒ වගේම ඔබ සතුව ඇති සංගීත උත්පාදන යන්ත්‍රය අති විශිෂ්ට නිර්මාණයක්. ඒ වගේම ඇනාලා එය භාවිතා කිරීම පිළිබඳව සියල්ල දන්නවා. ඇයට එම යන්ත්‍රයටත් සම්බන්ධ වීමට හැකි නම් වඩා ප්‍රයෝජනවත් වේවි."

ජෙසී ඇයගේ කතාව අවසන් කරන විටම ඇසුණේ ඇනාලාගේ කටහඬයි.

"සුබදායක පණිවිඩයක් මහාචාර්ය ජොනතන්."

ඇය කීවේ ඔවුන් සියලු දෙනාම කුතුහලයට පත් කරමිනි.

"විලියම්ගේ වෛද්‍ය වාර්තා සංසන්දනාත්මකව පරීක්ෂා කරනු ලැබුවා. ඔහු සියයට හැටක සුවයක් ලබා ගෙන තිබෙනවා. ඒ අනුව සංගීත චිකිත්සාව මේ සඳහා සුදුසුම ඖෂධයක්."

මහාචාර්ය ජොනතන් තම අසුනින් පැන්නේ භාවෙකු මෙනි. ප්‍රීතිය නිසා ඔහුගේ මුහුණ රතු වී තිබුණි.

"එහෙනම් පෘථිවියේ හොඳම පර්යේෂණ කණ්ඩායමට හිමි සම්මානය මේ වසරේ මගේ පර්යේෂණාගාරයට නේද? මේ පිළිබඳව අදම සියලුම ආයතන දැනුවත් කළ යුතුයි."

"කලබල වෙන්න එපා සහෝදරයා."

ඇල්බස් සිනාසෙන්නට විය. ඔහුගේ දෙනෙත් යොමු වුණේ ප්‍රීතියෙන් ඉපිළෙමින් සිටි චාල්ස් හා ජෙසී වෙතටයි.

"ඔව්, ඔබේ දෙදෙනා අද රාත්‍රී හතට මෙතනට පැමිණෙන්න. ඒ ඔබේ සමුගැනීමට. ඔබ දන්නා පරිදිම සියල්ලම සිදුවේවි. අද රාත්‍රියේ ඔබට ඔබේ ගෙදර ඔබේ ඇඳේ නිදා ගත හැකියි. නෝරාවත් ඇනාලාවත් ඩේවිස්වත් අමතක කරන්න එපා ජොනතන්."

ඇල්බස් පැවසුවේ සිනහව අතරිනි.

.............................

චාල්ස් හා ජෙසී ජොනතන්ගේ කාර්යාලයට පැමිණෙන විට මහාචාර්යවරුන් දෙදෙනා, ඩේවිස් හා නෝරා කාර්යාලය තුළට වී බලා සිටියහ. පරිගණකයේ දැල්වෙමින් තිබූ දීප්තිමත් ආලෝකය ඇනාලා ද එහි සිටින බවට සාක්ෂිය විය. ඔවුන් සියල්ලන්ගේම උණුසුම් සිනාවන් අතරින් කාර්යාලය හරහා ඇවිද ගිය ජෙසී හා චාල්ස් අසුන් ගත්හ.

"අතීතයෙන් ආ වීරවරුන්! ඔබ දෙදෙනාට ස්තූති කිරීමට මට වචන නැහැ. මේ ලෝකයම ඔබට ණයගැතියි. බොහොම ස්තූතියි."

මහාචාර්ය ජොනතන් ජෙසී හා චාල්ස් ඉදිරියේ හිස නමා ඔවුන්ට ආචාර කළහ.

"ඒ වගේම ඩේවිස්, මගේ දක්ෂ පර්යේෂකයා! ඔබ නැති නම් මේ කිසිවක් නැහැ. මා ඔබට ස්තූති කරන්නේ කොහොමද දන්නවාද? ඔබ හෙට සිට සේවයට වාර්තා කරන්නෙ පර්යේෂක ඩේවිස් ලෙස නෙමෙයි. ආචාර්ය ඩේවිස් ස්ටබ්ස් ලෙස. උසස්වීමකුත් සමඟ ඔබගේ වැටුප් වැඩිවීමකුත්

සිදුවෙනවා. හෙට ඔබේ පරිණකයට සියලුම ලියකියවිලි එවන්නම්."

සියලුදෙනාගේ අත්පොළසන් නාදය මධ්‍යයේ මහාචාර්යවරයා ඩේවිස්ගේ කර වටා අත යැව්වේය. ඩේවිස්ගේ දෑසේ සතුටු කඳුළු පිරී තිබුණි.

"ආ... ඇනාලා, නෝරා, ඔබ අපට දැක්වූ සහයෝගය වෙනුවෙනුත් යමක් කළ යුතුමයි. ඔබ අකමැතිද දින තුනක විවේක කාලයකට?"

ජොනතන් අසුනකට බර විය.

"මහාචාර්යතුමනි, ස්තුතියි ඔබට!. දින තුනක් ප්‍රමාණවත්. අපි නැවත පැමිණෙන විට පෙරටත් වඩා කාර්යක්ෂම සේවයක් ඔබට සැපයීමට සූදානම්."

ඇනාලාත්, නෝරාත් තොරතෝංචියක් නැතිව ස්තූති කරන්නට විය.

"ඔබ දෙදෙනාට වගේම මගේ සේවය සඳහා වන සියලු රොබෝවරුන්ටත් එම විවේකයම

හිමිවනවා. දැන් ඇනාලා, ඔබ සියලු රොබෝවරුන්ට එය දැන් දැන්විය යුතුයි. හෙට සිට දින තුනක් ඔබලාව ආරෝපණය නොකරන ලෙස රොබෝ මධ්‍යස්ථානයට දැනුම් දෙන්න. ඔබ ඔබේ සියලු සබඳතා විසන්ධි කර ප්‍රධාන පරිගණකයේ පමණක් රැඳී සිටින්න. එවිට ඔබව අක්‍රිය කිරීමට මට පහසුයි."

"හොඳයි මහාචාර්යතුමනි."

ඇනාලා මහාචාර්ය ජොනතන්ගේ නියෝගයට අවනත වූයේ හද පිරි සතුටිනි.

"නමුත් මහාචාර්යතුමනි, අප නැතිව ඔබ කොහොමද මේ වැඩ කටයුතු සියල්ලක්ම සිදුකරන්නේ?"

නෝරා ඇසුවේ කල්පනාකාරී හඬකිනි.

"ජෙසී ඩික්සන් මෙනෙවියගේ සංගීතය සමඟ මමත් දින තුනක් විවේකයෙන් ගත කරනවා. ඇල්බස් සහ මම සියුස් වනාන්තරයේ දින තුනක් සඳහා

නවාතැනක් වෙන් කළා. මගේ සියලු පර්යේෂණ සහායකයින්ට නිවාඩුවකුත් ලැබෙනවා.”

ජොනතන් පැවසුවේ උතුරා යන ප්‍රීතියකිනි. ඔහුගේ සහෝදරයා ද සිටියේ ඊට නොදෙවෙනි සතුටකිනි. සියලු දෙනාම කොතරම් සතුටින් සිටියත් ඔවුන්ගේ සිත් තුළ සියුම් දුකක්ද ඇති වී තිබුණි. ඒ චාල්ස් හා ජෙසීගේ සමුගැන්ම නිසයි.

“හොඳයි, දැන් අපි කරන්න ඕන අපේ මිතුරන්ව නැවත ඔවුන් සිටිය යුතු තැනට යැවීම. ඉතිං මහත්මයා, ඔබ දැනගත යුතුයි නේ කාල තරණය සිදුවන විදිහ ගැන. ඔබ මෙහි පැමිණි මොහොතේ සිටම ඔබ වෙනුවට ඔබ වැනිම ප්‍රතිබිම්බයක් ඔබේ ලෝකයේ තිබෙනවා. මට ඒ ගැන දෛනික වාර්තාවන් ලැබුණා. ඒ අනුව එහි කිසිම ගැටලුවක් ඇතිවෙලා නෑ. ඔබ දැන් කාල තරණය සිදුකරන විට, මේ දින කිහිපයේ ඔබේ මතකයන් නැති වී ඒ වෙනුවට ඔබේ ප්‍රතිබිම්බයේ මතක ඔබේ මනසට ඇතුළු වෙනවා. කුඩා අපැහැදිලි තිගැස්සීමක් හැර වෙනත් කිසිවක් ඔබට දැනෙන්නේ

නෑ. ඔබ ඔබේ ලෝකයට පිවිසි විට මිනිත්තු කිහිපයක සිහි විසඥ වීමක් ඇති වෙනවා. ඉන්පසුව ඔබටවත් ඔබ පසුගිය දින කිහිපය ගත කළ අයුරු ගැන සැකයක් ඇතිවෙන්නෙ නෑ. ඔබ ඔබේ ලෝකයට යන විටම ඔබේ ප්‍රතිබිම්බය අතුරුදහන් වේවි."

ඇල්බස්ගේ කතාවෙන් පසු ජෙසීගේ මුහුණ අඳුරු විය.

"ඒ කියන්නේ මේ අපූරු දින කිහිපය අපට අමතක වෙනවා කියන එක ද?"

ඇය කීවේ සිහින් කටහඬකිනි.

"ඔව්, ඒක කාල තරණය සම්බන්ධ නීතියක්. ඔබේ සමාජයමයි  තව ශතවර්ෂ ගණනාවකින් මේ තත්වයට දියුණු වෙන්නෙ. ඒ ගලා යාමට බාධා කරන්න අපට බෑ. ඒ වගේම ඒක ඔබේ මානසික තත්වයටත් බලපෑමක් විය හැකියි."

මහාචාර්ය ජොනතන් ඇය සනසන අටියෙන් පැවසුවේය.

"ඒ වගේම එතැන් සිට අපේ සම්බන්ධය විසන්ධි වෙනවා. නැවත අපට ඔබව සම්බන්ධ කර ගත නොහැකියි. එය නීතියට පටහැණියි. නැවත අප ඔබව ගෙන්වා ගන්නෙත් නෑ. එකම පුද්ගලයෙක් එක් වරකට වඩා වැඩි වාර ගණනක් කාල තරණය කිරීම නීති විරෝධියි."

මහාචාර්ය ඇල්බස් පැහැදිලි කළේය. ජෙසී හා චාල්ස් හිස වැනුවේ එය පැහැදිලි බව පැවසීමටයි.

ඉන් පසුව ඔවුහු කිසිඳු කතාබහක් නොමැතිවම කාල තරණ යන්ත්‍රය තබා ඇති කාමරයට පිවිසියහ. ජෙසී මග දිගට වූ සියලුම දේවල් දෙස බලමින් ගියේ මේවාට සමුදිය නොහැකි යැයි සිතමිනි.

කාලතරණ යන්ත්‍රය තබා ඇති කාමරය තුලදී ස්තුති කිරීම්, සමුගැනීම් හා අතට අත දීම් වල අඩුවක් වුණේ නැත. චාල්ස් හා ජෙසී සැම දෙනාටම සමුදුන්නේ කඳුළු පිරි දෙනෙතිනි. රෝබෝවරියක් වුවත් ඇනාලා ද තම ශෝකය ප්‍රකාශ කළේ හැඬුම්බරව යි. ඇයත් ජෙසීත් මේ දින කිහිපයේ

සහෝදරියන් දෙදෙනෙකු මෙන් සමීපව සිටි බව කාටත් රහසක් නොවීය.

අවසාන වශයෙන් ඡායාරූපයකට ද පෙනී සිටි ජෙසී හා චාල්ස් කාලතරණ යන්ත්‍රය තුළට පිවිසියේ දුක සතුට මුසු හැඟීමකිනි. අසල වූ තිරයක ඔවුන්ගේ ප්‍රතිබිම දිස් විය. චාල්ස්ගේ ප්‍රතිබිම්බය රෝහලේ ඔහුගේ පෞද්ගලික කාමරයේ රැඳී සිටියේය. ජෙසීගේ ප්‍රතිබිම්බය ඇගේ කාමරයේ නිදා සිටියාය.

චාල්ස් හා ජෙසී අවසන් වතාවටත් සිය මිතුරන් දෙස බලා දිග හුස්මක් ගත්තෝය. ඒත් සමඟම ඇති වූ ආලෝකය සමඟ ඔවුන් කරකැවෙමින් වේගයෙන් යමක් වෙත ඇදී යන්නට විය.

තත්පර කිහිපයකට පසු චාල්ස් පුටුවක් මතට ඇද වැටුණු ගමන්ම ඔහුගේ දෑස් පිය විණි. තම සුවපහසු ඇඳ මතට වැටුණු ජෙසීගේ සිහිය විසඳෙ විය. නමුත් ඒ මිනිත්තු පහකට පමණි.

සිහින් තිගැස්සීමක් සමග අවදි වූ චාල්ස් තම කාමරයෙන් පිටතට ගියේ වාට්ටුවේ සිටින රෝගීන් පරීක්ෂා කර බැලීමට යි. ජෙසී ද අවදි වූ ගමන්ම නැවත ඇඳේ අනෙක් පසට හැරී නිදා ගත්තේ තමා වසර තුන් සියයකින් එපිට ලොවකට වීරවරියක් බව නොදැනයි.

සමාප්තයි!

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා

විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වේ. මීට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්

ISBN -978-624-208-372-8
9 786242 083728
©කතෘ ප්‍රකාශනයකි.